(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 19.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 ජූලි මස 06 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0028/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ලබා ගත් ලාභය;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන දේශීය හා විදේශීය සංචිත ප්‍රමාණය;

(iii) මෙම සංචිත වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ලබා ගන්නා ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ හත සඳහා ජූනි 30 වැනි දිනට සහ දෙසැම්බර් 31 වැනි දිනට, රාජ්‍ය මුදල් ඌනතාවය මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබා දී ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0063/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට වසරකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බැද්දෙවැව ග්‍රාම නිලධාරි වසමේ, පදලංගල සිට 250 මාර්ගයේ කි.මී. 1.5 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ගැලවී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0271/'10

3\.

ගරු රාජීව විජේසිංහ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජය සහ අනිකුත් ආයතන විසින් ජනමාධ්‍යවේදීන් වෙත සපයා දී ඇති පුහුණුවීම් අවස්ථා කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීම සඳහා වන කලාපීය ආයතන සමඟ සිදු කරන හුවමාරු වැඩසටහන් සහ කලාපීය සහ අන්තර්ජාතික පුවත්පත් සහ මාධ්‍ය ආයතන සමඟ පවත්වා ගෙන යන ආධුනිකත්ව පුහුණු වැඩසටහන් මඟින් එවැනි පුහුණු අවස්ථා වැඩි දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් විභාග පැවැත්වීමට පමණක් නොව පුවත්පත් අධීක්ෂණයට සහ සාවද්‍ය තොරතුරු පළ කිරීම සහ වෙනත් නුසුදුසු හැසිරීම් සම්බන්ධයෙන් ඒවාට අවවාද කිරීම සඳහා ද පුවත්පත් පැමිණිලි කොමිසම උනන්දු කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0301/'10

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව පොරොන්දු වූ රු. 2500.00 වැටුප් වැඩිවීම ලබා දෙන්නේ ද;

(ii) එසේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම වැඩිවීම අදාල වන රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

(v) ලබා දෙන වෙනත් සහන මොනවාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0064/'10

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට මාස 5 කට පෙර තාර දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හත්පොරුව, අලිඔලුආර ග්‍රාම නිලධාරි වසමේ, අලිඔලුආර නුගේ අසල සිට හත්පොරුව දක්වා මාර්ගයේ කි.මී. 1 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට තාර කුට්ටි වශයෙන් ගැලවී, ගමන් කිරීමට නොහැකි තත්වයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0117/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවාට ජාත්‍යන්තර හෝ ආසියානු වර්ගීකරණයක් ලැබී තිබේද;
(iii) එක් එක් විශ්වවිද්‍යාලය නඩත්තුව සඳහා වසරකට යන වියදම කොපමණද;
(iv) එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;
(v) එක් සිසුවෙකු සඳහා දරන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ විශ්වවිද්‍යාල මෙම රටට ගෙන්වා, ඒවා මෙහි ක්‍රියාත්මක කරවීමට රජය උත්සාහ කරන්නේද;
(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0272/'10

7.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨ සහ අනිකුත් ගුරු පුහුණු ආයතනයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලවල තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ ජාතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇති පැමිණිලි කවරේද;
(ii) එවැනි පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙතින් ලැබී ඇති තීන්දු කවරේද;
(iii) ඉහත කී තීන්දු ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට පළ කරන ලද වෙළඳ දැන්වීම් වල සඳහන් වයස පිළිබඳ නියමයන් සම්බන්ධයෙන් පැවැති විෂමතාවන් කවරේද;
(ii) මේ සම්බන්ධයෙන් වන මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කරන බවට සහතිකවීමට සහ බඳවාගැනීම් නියමයන් සම්බන්ධයෙන් කිසියම් විෂමතාවන් ඇත්නම්, ඒවා නිවැරදි කිරීමට එතුමා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0302/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීගිරිය ලෝක උරුමයේ බඹර ජනපද පලවා හැරීමේ දී රසායනික ද්‍රව්‍යයක් භාවිතා කළේද;
(ii) බඹරුන් පලවා හැරීම හේතුවෙන් වෙනත් කෘමි විශේෂ එම භූමිය ආක්‍රමණය කර තිබේද;
(iii) එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර කවරේද;
(iv) සීගිරිය පුරාවිද්‍යා භූමිය ජපන් සමාගමකට විකුණා හෝ බදු දී හෝ ඒ හා සමාන කටයුත්තක් කර තිබේ ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සීගිරි ගල පාමුල වැසිකිළි පද්ධතියක් ඉදිකරන බව එතුමිය දන්නෙහිද?

(ඇ) සීගිරි ගලට හානි වන අන්දමින් සිදු කරන සියලුම ඉදිකිරීම් නතර කිරීමට එතුමිය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2, 3, 4, 5, 6, 7, 8, 9 සහ 10 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

ගරු කරු ජයසූරිය මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය(අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"තාරුණ්‍යයට හෙටක් සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු රොෂාන් රණසිංහ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රෝහිත අබේගුණවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2010) — (හයවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (ජූලි 05 වැනි දින ප්‍රගතිය)

*2

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2010 ජූනි මස 23 දිනැති අංක 1659/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*3

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 (ඇ) වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2010 ජූනි මස 02 දිනැති අංක 1656/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*4

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2010 මැයි 31 දිනැති අංක 1656/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*5

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය යටතේ කියවිය යුතු (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2010 මැයි 31 දිනැති අංක 1656/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අංක 915 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*6

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 2),— සුරාබදු ආඥාපනතෙහි (52 වැනි අධිකාරිය වූ) 22 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින්, 2009 මාර්තු 26 දිනැති අංක 1594/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද අංක 907, 908 සහ 909 දරන සුරාබදු නිවේදනයන්හි සහ 2008 ඔක්තෝබර් 07 දිනැති අංක 1570/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද අංක 906 දරන සුරාබදු නිවේදනයෙහි සඳහන් රීති පරිච්ඡින්න කරමින් පනවන ලදුව, 2010 ජූනි 23 දිනැති අංක 1659/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අංක 916, 917, 918 සහ 919 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*7

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2010 මැයි මස 31 දිනැති අංක 1656/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ,2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*8

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ නියෝගය,— 2010.07.05 දින ඉදිරිපත් කරන ලද, (235 වන අධිකාරිය වූ) රේගු ආඥා පනතේ 10(අ) වැනි වගන්තිය යටතේ ආනයන තීරු බද්ද සම්බන්ධයෙන් වූ නියෝගය අනුමත කළ යුතුය (2010 මැයි 31 දිනැති අංක 1656/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය )

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*9

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු (සංශෝධිත) පනත යටතේ නිවේදනය,— 2010.07.05 දින ඉදිරිපත් කරන ලද, 2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ “ඊ” උප ලේඛණයේ 10 වැනි වගන්තිය යටතේ පාවිච්චි කළ මෝටර් වාහන වල වටිනාකම (මිල) නියම කිරීම සම්බන්ධයෙන් වූ නිවේදනය අනුමත කළ යුතුය (2010 ජූනි 01 දින අංක 1656/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*10

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 මැයි 07 දිනැති අංක 1652/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලැබ, 2010.07.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*11

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11,17 සහ 20 (2) වැනි වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 43 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2009 ජූලි 31 දිනැති අංක 1612/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.07.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*12

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 6 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 6 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 321,000,000<br>රු. 260,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 321,000,000<br>රු. 210,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.01.01 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*13



අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 7 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 7 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,200,000,000<br>රු. 1,800,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,200,000,000<br>රු. 700,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 500,000,000<br>රු. 850,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.01.01 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*14

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 20 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 20 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 5,300,000 සිට<br>රු. 4,300,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*15

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 21 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 21 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25003 "විවිධ අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 200,000,000 සිට<br>රු. 20,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 560,000,000 සිට<br>රු. 44,700,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 400,000,000 සිට<br>රු. 588,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,

කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*16

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 23 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 23 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01602 "අල්ලස් වැටලීම් වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,000,000 සිට රු. 10,700,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*17

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2009 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා | 12501 | - | - | - | - | 20,000,000 | 30,000,000 | 1 |
| 2 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 29001 | - | - | - | - | 90,000,000 | 97,000,000 | 2 |
| 3 | අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා | 11001 | - | - | - | - | 50,000,000 | 55,000,000 | 3 |
| 4 | අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යවරයා | 16701 | - | - | - | - | 9,000,000 | 13,000,000 | 4 |
| 5 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 21501 | - | - | - | - | 130,000,000 | 247,000,000 | 5 |
| 6 | නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යවරයා | 14501 | - | - | - | - | 15,000,000 | 21,000,000 | 8 |
| 7 | වෙළෙඳ, අළෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යවරයා | 11601 | - | - | - | - | 21,000,000 | 25,000,000 | 9 |
| 8 | ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | 21101 | - | - | - | - | 175,000,000 | 245,000,000 | 10 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 23,500,000 | 18,000,000 | - | - | 11 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 25801 | - | - | - | - | 155,000,000 | 172,000,000 | 12 |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | - | - | 165,000,000 | 169,000,000 | 13 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | 27301 | - | - | - | - | 120,000,000 | 142,000,000 | 14 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | 29,500,000 | 27,000,000 | 72,000,000 | 170,000,000 | 15 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය, කිලිනොච්චිය | 26801 | - | - | - | - | 26,000,000 | 29,000,000 | 16 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 27801 | - | - | 35,400,000 | 26,000,000 | 115,000,000 | 132,000,000 | 17 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව | 27501 | - | - | - | - | 73,000,000 | 74,000,000 | 18 |
| 17 | ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා | 11501 | - | - | - | - | 6,500,000 | 8,200,000 | 19 |
| 18 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | - | - | 600,000,000 | 677,000,000 | 22 |
| 19 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 30501 | - | - | - | - | 5,000,000 | 6,000,000 | 24 |
| 20 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 32301 | - | - | - | - | 1,185,000 | 1,300,000 | 25 |
| 21 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 32401 | - | - | - | - | 1,900,000 | 8,500,000 | 26 |

අ/ක. මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010 අප්‍රේල් 06 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*18.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) මාසික වැටුප පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) | රු. 65,000/- |

තවද, මෙම මාසික වැටුප තුළ මීට ප්‍රථම පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති ගෙවල් කුලී දීමනාව ද ඇතුළත්ව ඇති බැවින්, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්) රු. 65,000/- ක මාසික වැටුපට අමතරව 2009.01.01 දින සිට වෙනත් දීමනා සඳහා හිමිකමක් නොමැති බව ද, මෙම පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් නිශ්චය කරනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2010) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.